# දැහැනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අත්වැලක

විකල්ප
ප්‍රතිපත්ති
කේන්ද්‍රය

2015 මැයි

# දහනව වන
# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා
# සංශෝධනයට
# අත්වැලක්

## විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

## 2015 මැයි

# විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.


ලිපිනය : 24/2, 28 වන පටුමග, මල් පාර, කොළඹ 7, ශ්‍රී ලංකාව

දුරකතන : +94 (11) 2565304/5/6

ෆැක්ස් :+94 (11) 4714460

වෙබ් අඩවිය : www.cpalanka.org,

විද්‍යුත් තැපැල : info@cpalanka.org

## පසුබිම

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ලෙස නම් කරන ලද පනත් කෙටුම්පතක් 2015 මාර්තු 16 දා ගැසට් මගින් ප්‍රකාශයට පත් වූ අතර, එය 2015 මාර්තු 24 වනදා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලදී. ඉන් පසුව කැබිනට් අමාත්‍ය මණ්ඩලය (මෙහි පහත "කැබිනට් මණ්ඩලය" යනුවෙන් යෙදේ) විසින් මෙම පනත් කෙටුම්පතට අදාළ වෙනස්කම් කිහිපයකට අනුමැතිය දෙන ලද අතර, පාර්ලිමේන්තුවේ කාරකසභා අවස්ථාවේදී මෙම වෙනස්කම් සිදු කරනු ඇති බවට පුවත්පත් වාර්තාවල සඳහන් විය.

ඉන්පසුව, ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද එම පනත් කෙටුම්පත සම්පූර්ණයෙන් ම හෝ එහි කොටසක් හෝ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක් විසින් සම්මත කිරීමට අමතරව ජනතාව විසින් ජනමත විචාරණයක් මගින් ද සම්මත කළ යුතු දැයි තීන්දුවක් ලබා ගැනීම සඳහා පුද්ගලයන් කිහිප දෙනෙකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සම් ඉදිරිපත් කරන ලදී. එම පෙත්සම් සළකා බැලීම සිදු වන අතරතුර දී ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද එම පනත් කෙටුම්පත සඳහා ඉහත කී කැබිනට් මණ්ඩලය අනුමත කර තිබූ වෙනස්කම් නීතිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලදී. එම වෙනස්කම් අමාත්‍ය මණ්ඩලය විසින් ද අනුමත කර තිබුණි. ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පෙත්සම් සළකා බැලීම සිදු වූ කාලය තුළ දී පාර්ශ්වකරුවන් විසින් ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද මුල් පනත් කෙටුම්පත පිළිබඳවත්, යෝජිත වෙනස්කම් පිළිබඳවත් කරුණු ඉදිරිපත් කරන ලදී.

ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද පනත් කෙටුම්පතෙහි 11 සහ 26 වගන්තිවල ඇතුළත් පහත සඳහන් ඡේද පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත කර ගැනීමට අමතරව ජනතාව විසින් ජනමත විචාරනයකින් ද සම්මත කර ගත යුතු බව SC SD 4-19/2015 දරණ නඩුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලදී.

**(SC SD 4-19/2015 දරණ නඩුවෙහි ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව) ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද පනත් කෙටුම්පතෙහි ඇතුළත්, ජනතාව විසින් ජනමත විචාරනයකින් ද සම්මත කර ගත යුතු වගන්ති**

**පනත් කෙටුම්පතෙහි 11 වන වගන්තිය**

**යෝජිත 42 (3) වගන්තිය** - අග්‍රාමාත්‍යවරයා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වන්නේ ය.

**යෝජිත 43 (1) වගන්තිය** -අග්‍රාමාත්‍යවරයා විසින්, අමාත්‍යවරුන් සංඛ්‍යාවද අමාත්‍යංශ සහ එකී අමාත්‍යවරුන්ට පැවරෙන විෂය සහ කාර්යයන් ද නිශ්චය කරනු ලැබිය යුතු ය.

**යෝජිත 43 (3) වගන්තිය** - අග්‍රාමාත්‍යවරයා විසින් කවර වේලාවක දී වුව ද, කැබිනට් මණ්ඩලය වෙත පවරන ලද විෂය සහ කාර්ය වෙනස් කිරීම සහ කැබිනට්මණ්ඩලයේ සංයුතිය වෙනස් කිරිම සඳහා ජනාධිපතිවරයාට නිර්දේශ කිරීම කරනු ලැබිය හැකි ය.

**යෝජිත 44 (2) වගන්තිය** - කැබිනට් නොවන අමාත්‍යවරයන්ට පැවරිය යුතු විෂය සහ කාර්ය අග්‍රාමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

**යෝජිත 44 (3) වගන්තිය** - කැබිනට් නොවන අමාත්‍යවරයන්ට පවරනු ලැබූ විෂය, අග්‍රාමාත්‍යවරයා විසින් කවර වූ හෝ විටක වෙනස් කරනු ලැබිය හැකි ය.

**යෝජිත 44 (5) වගන්තිය** -කැබිනට් මණ්ඩලයේ කවර වූ හෝ අමාත්‍යවරයකු විසින් තමන් වෙත පැවරී ඇති යම් බලයක් හෝ කාර්යයක් අග්‍රාමාත්‍යවරයාගේ ඉල්ලීම මත, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් කැබිනට් නොවන අමාත්‍යවරයකුට පවරා දිය හැකි ය.

**පනත් කෙටුම්පතෙහි 26 වන වගන්තිය**

**යෝජිත 104ආ (5) (ඇ) වගන්තිය** -මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද රෙගුලාසි රජයේ හෝ පුද්ගලික ගුවන් විදුලි සේවා හෝ රූපවාහිනී සේවා පවත්වාගෙන යන්නකු විසින් උල්ලංඝනය කරනු ලැබූ අවස්ථාවක දී, එහි කළමනාකරණය භාර ගැනීමට නිසි බලධරයකු පත් කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට බලය ඇත.

එම නිසි බලධරයා විසින්, දේශපාලන විකාශන හෝ ඡන්ද විමසීම් කෙරෙහි බලපාන වෙනත් යම් විකාශනයක් හෝ සම්බන්ධයෙන් අදාළ ආයතනයෙහි කළමනාකරණය එම ඡන්ද විමසීම අවසන් වන තෙක් තමන් යටතට ගනු ලැබිය යුතු ය.

- ජනාධිපතිවරයා ජාතික සමගියේ සංකේතය විය යුතු බව සඳහන් යෝජිත 33 (1) ව්‍යවස්ථාව **වැරදි** බවටත්, එය **ඉවත් කළ යුතු බවටත්** ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලදී.

ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද පනත් කෙටුම්පත සඳහා ඉදිරිපත් කරනු ලැබූ සංශෝධනයන් (කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද) සම්බන්ධයෙන් නීතිඥවරුන් කිහිප දෙනෙකු විසින් ම ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු ඉදිරිපත් කරනු ලැබුව ද, එම ලේඛනයෙහි ඇතුළත් කිසිදු වගන්තියක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විශේෂයෙන් අදහස් දැක්වූයේ නැත. අවසානයේ දී

පාර්ලිමේන්තු විවාදය සඳහා ඉදිරිපත් කරනු ලැබුවේ 2015 මාර්තු 16 වනදා ගැසට් පත්‍රයෙහි පළ වූ පනත් කෙටුම්පතම ය.

මෙම පනත් කෙටුම්පත 2015 අප්‍රේල් 28 ද පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත කරන ලදී. එක් එක් මන්ත්‍රීවරයා ඡන්දය පළ කළ ආකාරය නම් වශයෙන් සටහන් කරන ලදී (පනතට පක්ෂව ඡන්ද -212, විරුද්ධව -1, ඡන්දය දීමෙන් වැළකී සිටි ගණන -1, නොපැමිණි ගණන-10). කාරක සභා අවස්ථාවේ දී සළකා බැලීම සඳහා පනත් කෙටුම්පතට සංශෝධන 174ක් (රජයෙන් සංශෝධන 63ක් සහ විපක්ෂයෙන් සංශෝධන 111ක්) ඉදිරිපත් වූ බව වාර්තා විය.

**දහනව වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සිදු වූ ප්‍රධාන වෙනස්කම්**

**විධායක ජනාධිපති ධුරයෙහි වෙනස්කම්**

1. ජනාධිපතිවරයාගේ ධුර කාලය අඩු කිරීම- ජනාධිපතිවරයාගේ ධුර කාලය වසර 6 සිට 5 දක්වා අඩු කරන ලදී. ***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 3 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 (2) ව්‍යවස්ථාව)***

2. කිසියම් පුද්ගලයෙකුට ජනාධිපති ධුරය දැරිය හැක්කේ දෙවරක්ය යන සීමා කිරීම නැවත හඳුන්වා දීම - ඒ අනුව ජනාධිපතිවරයා වශයෙන් දෙවරක් තේරී පත් වූ පුද්ගලයෙකු තුන්වන වරට ජනාධිපති ධුරය සඳහා තරග වැදීමට සුදුසුකම් නොලබයි. ***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 4 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 (2) ව්‍යවස්ථාව)***

3. පහත සඳහන් පුද්ගලයෝ ජනාධිපති ධුරය සඳහා තේරී පත් වීමට සුදුසුකම් නොලබති;

වයස අවුරුදු 35ට අඩු පුද්ගලයෙකු ***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 21 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 (අ) ව්‍යවස්ථාව)*** හෝ

- ද්විත්ව පුරවැසිභාවය ලබාගත් තැනැත්තෙකු (මෙහි පහත 24 වන ඡේදය බලන්න)

4. ජනාධිපතිවරයාට අමතර කාර්ය පැවරීම- පහත කාර්යයන් ද ඊට අයත් වේ:

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරන බවට ද ආරක්ෂා කරන බවට ද වගබලා ගැනීම;

- ජාතික සමගිසන්ධානය හා ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම;

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සහ VIIඅ ව්‍යවස්ථාවේ සඳහන් ආයතනවල නිසි ක්‍රියාකාරිත්වය පහසුකරලීම; සහ

- මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම සඳහා උචිත වාතාවරණයන් නිර්මාණය කිරිම තහවුරු කිරීම.

***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 5 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 (1) ව්‍යවස්ථාව)***

5. ජනාධිපතිවරයාට සිය අභිමතය පරිදි අග්‍රාමාත්‍යවරයා ධුරයෙන් ඉවත් කිරීමට තව දුරටත් බලය නොලැබේ.***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 9 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 (2) ව්‍යවස්ථාව)***

6. කිසියම් කැබිනට් අමාත්‍යවරයෙකු, කැබිනට් නොවන අමාත්‍යවරයෙකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු එම ධුරයට පත් කිරීමේ දී සහ ඉන් ඉවත් කිරීමේ දී ජනාධිපතිවරයා අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත කටයුතු කළ යුතු ය.***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 9 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (2), 44 (1), 45 (1) සහ 46 (3)(අ) ව්‍යවස්ථාවන්)***

කෙසේ වුව ද කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාව තීරණය කිරීමේ දී මෙන් ම, එක් එක් කැබිනට් අමාත්‍යවරයන්ට සහ කැබිනට් නොවන අමාත්‍යවරුන්ට විෂයයන් පැවරීමේ දී ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසිය යුතු වන්නේ එසේ කිරීමට අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවල පමණි. ***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 9 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) සහ 44 (2)ව්‍යවස්ථාවන්)***

ජනාධිපතිවරයා විසින් කවර අවස්ථාවක දීවුව ද,

(අ) කැබිනට් අමාත්‍යවරුන් සහ කැබිනට් නොවන අමාත්‍යවරුන් වෙත පවරන ලද විෂය සහ කාර්ය වෙනස් කිරීම, සහ

(ආ) කැබිනට් මණ්ඩලයේ සංයුතිය වෙනස් කිරීම ද කරනු ලැබිය හැකි ය.

කැබිනට් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට සහ පාර්ලිමේන්තුව වෙත කැබිනට් මණ්ඩලය දරන වගකීමේ අඛණ්ඩ පැවැත්මට එවැනි වෙනස් කිරීමක් බල නොපාන්නේ ය.
***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 9 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (3) සහ 44 (3)ව්‍යවස්ථාවන්)***

7. ජනාධිපතිවරයා විසින් ඔහුගේ/ ඇයගේ නිල තත්වය උපයෝගී කොටගෙන සිදු කරන ක්‍රියාවන් සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකම් පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලයට යටත් විය යුතුය.19 වන සංශෝධනයට පෙර ජනාධිපතිවරයාට එරෙහිව **<u>කිසිඳු නඩු කටයුත්තක්</u>** පැවරීමට හෝ පවත්වාගෙන යාමට හැකියාවක් නොතිබුණි.මෙම සංශෝධනයෙන් පසුව ජනාධිපතිවරයාට ලැබෙන මුක්තිය (ඔහුට එරෙහිව නඩු පැවරීමට නොහැකි වීම)"සිවිල්" සහ "අපරාධ" නඩු කටයුතුවලට පමණක් සීමා වී ඇත.***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 7 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35 ව්‍යවස්ථාව)***

| **19 වන ව්‍යවස්ථා සංශෝධනයට පෙර 35 (1) ව්‍යවස්ථාව පැවති ආකාරය** | නව **35 (1) ව්‍යවස්ථාව** |
|---|---|
| ජනාධිපතිවරයා ලෙස ධූරය දරන කවර වූ හෝ තැනැත්තෙකු විසින් පෞද්ගලික තත්ත්වයෙහි ලා හෝ නිල තත්ත්වයෙහි ලා හෝ කරන ලද හෝ නොකර හරින ලද කිසිවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව **<u>කිසිම අධිකරණයක හෝ විනිශ්චය අධිකාරයක කිසිම නඩු කටයුත්තක්</u>** පැවරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.*(අවධාරණය එක් කර ඇත)* | යම් තැනැත්තකු ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා ලෙස ධූරය දරන අවස්ථාවක දී, ඔහු විසින් පෞද්ගලික තත්ත්වයෙහි ලා හෝ නිල තත්ත්වයෙහි ලා කරන ලද හෝ නොකර හරින ලද කිසිවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව **<u>කිසිම සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක්</u>** පැවරීම හෝ පවත්වාගෙන යාම හෝ නොකළ යුත්තේ ය *(අවධාරණය එක් කර ඇත)* |

8. පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන ලද (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් නොවන) ඕනෑම පනත් කෙටුම්පතක් ජනමතවිචාරණයක් මගින් ජනතාව වෙත ඉදිරිපත් කිරීමට ජනාධිපතිවරයා වෙත පැවති බලය ඉවත් කෙරේ. ***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 19 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මීට පෙර 85 (2) ලෙස පැවැති ව්‍යවස්ථාව)***

9. 19 වන ව්‍යවස්ථා සංශෝධනයට පෙර, වෙනත් කැබිනට් අමාත්‍යවරයෙකුට පවරා නොමැති යම් විෂයයක් හෝ කාර්යයක් ජනාධිපතිවරයා විසින් තමාට ම පවරා ගැනීම කළ හැකිව තිබුණි.19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙම වගන්තිය ඉවත් කර ඇත.***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 9 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මීට පෙර 44 (2) ලෙස පැවති ව්‍යවස්ථාව ඇතුළු තවත් වගන්ති කිහිපයක් ඉවත් කරන ලදී).*** කෙසේ වුව ද, 19 වන ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වන දිනයෙදී ජනාධිපතිවරයා ලෙස ධුරය උසුලන පුද්ගලයා සඳහා විශේෂ ප්‍රතිපාදන හඳුන්වා දී තිබේ.***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 50 (අ) සහ 51 වන වගන්ති)***

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ ස්වාධීන කොමිෂන් සභා

10. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 7 දෙනෙකුගෙන් සහ විශිෂ්ටත්වයෙන් හා අවංක භාවයෙන් යුත්, පොදු වෘත්තීය ජීවිතයේ දී කීර්තිය ලත්, කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයන් නොවන පුද්ගලයන් 3 දෙනෙකුගෙන් (මෙහි පහත ඇතැම් තැනක "විශිෂ්ට පුද්ගලයන්" ලෙස හැඳින්වේ) සමන්විත වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් (මෙහි පහත

ඇතැම් තැනක "සභාව" ලෙස හැඳින්වේ) සඳහා ප්‍රතිපාදන දක්වා ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙහි සංයුතිය පහත පරිදි වේ;

| | |
|---|---|
| නිල බලයෙන් පත් වන සාමාජිකයන් **<u>තිදෙනෙකි</u>** | කථානායකවරයා, අග්‍රාමාත්‍යවරයා සහ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ (1) (අ) (ආ) සහ (ඇ) ව්‍යවස්ථාවන්)*** |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් **<u>සිව් දෙනා</u>** මෙසේ ය. | **එක්** පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ.***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ (1) (ඇ)ව්‍යවස්ථාව)***<br><br>අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන දෙදෙනාගේ ම නාම යෝජනා කිරීම මත ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් **දෙදෙනෙකු** පත් කරනු ලැබේ.***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ (1)*** |

| | |
|---|---|
| | ***(ඉ)ව්‍යවස්ථාව)***<br><br>පාර්ලිමේන්තුවේ නියෝජනය ඇති දේශපාලන පක්ෂවල හෝ ස්වාධීන කණ්ඩායම් වල (අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා අයත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් හැර) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ බහුතරයේ එකඟත්වය මත නාම යෝජනා කිරීමෙන් **එක්** පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, පත් කරනු ලැබේ. ***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ (1) (ඊ)ව්‍යවස්ථාව)*** |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් කරනු ලබන විශිෂ්ට පුද්ගලයන් <u>**තිදෙනා**</u> මෙසේ ය. | විශිෂ්ටත්වයෙන් හා අවංක භාවයෙන්යුත්, පොදු වෘත්තීය ජීවිතයේ දී කිර්තිය ලත්, කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයන් නොවන තැනැත්තන් **තිදෙනෙකු** අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් නම් කරනු ලැබේ. අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් සිදු කරන ලද නාම යෝජනා පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබිය යුතු ය. ***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය, ආණ්ඩුක්‍රම*** |

| | |
|---|---|
| | ***ව්‍යවස්ථාවේ 41අ (1) (ඉ), 41අ (4) සහ 41අ (1) (5)ව්‍යවස්ථාවන්)*** |

11. 41අ (1) අනු ව්‍යවස්ථාවේ (ඉ) සහ (ඊ) ඡේදයටතේ කරන ලද නාම යෝජනා (එනම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිව් දෙනා සහ විශිෂ්ට පුද්ගලයන් තිදෙනා) නිශ්චිතව දක්වමින් ලිඛිත දැනුම්දීමක් ජනාධිපතිවරයා වෙත ලැබී දින දහහතරක් ඇතුළත ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඒ අවශ්‍ය පත්කිරිම් කරනු ලැබිය යුතු ය. එසේ කිරීමට ජනාධිපතිවරයා අපොහොසත් වුවහොත්, නාම යෝජිත තැනැත්තන්, එකී කාල පරිච්ඡේදය අවසන් වූ දින සිට බලපවත්වන පරිදි සභාවේ සාමාජිකයන් ලෙස **<u>පත්කරනු ලැබූ ලෙස සලකනු ලැබිය</u>** යුතු ය.

***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ (6)ව්‍යවස්ථාව)***

12. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙහි කාල සීමාව;

පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, කථානායකවරයා, අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා එකී විසුරුවා හැරීමට පසුව පවත්වනු ලබන මහ මැතිවරණයට පසුව පත්වන නව පාර්ලිමේන්තුවේ කථානායකවරයා, අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධපක්ෂයේ නායකයා තෝරා පත්කරගනු ලබන තෙක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් ලෙස තවදුරටත් ධුර දැරිය යුතු ය.

***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ (7)ව්‍යවස්ථාව)***

41අ (1) අනු ව්‍යවස්ථාවේ (ඈ)සිට (ඊ) ඡේද යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් කරනු ලැබූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිව් දෙනා පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන්, මහ

මැතිවරණයට පසුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතුරින් නව සාමාජිකයන් එම ව්‍යවස්ථාවට අනුව පත් කරනු ලබන තෙක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් ලෙස තවදුරටත් ධුර දැරිය යුතු ය.***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ (7)ව්‍යවස්ථාව)***

(ඉහත විස්තර කළ පරිදි) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් කරනු ලැබූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිව් දෙනා සහ විශිෂ්ට පුද්ගලයන් තිදෙනා පහත අවස්ථාවක් යටතට පත් වුවහොත් මිස **<u>වසර තුනක</u>** කාලයක් ධූරය දැරිය යුතු ය. එනම්ः -

- ඉල්ලා අස්වුවහොත්,

- තම ධූරයේ කටයුතු තවදුරටත් කරගෙන යාමට නොහැකි ශාරීරික හෝ මානසික අශක්නුතාවයකට පත්ව ඇති බවට අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන දෙදෙනාම මතයක් ඇති කර ගන්නා අවස්ථාවක ඒ මත ජනාධිපතිවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත්,

- චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු විෂයෙහි ප්‍රජා අශක්නුතා නියම කිරීමේ යෝජනා සම්මතයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාවට අනුකූලව සම්මත කරනු ලැබ ඇත්නම්

- සභාවේ පූර්ව අවසරය ලබා නොගෙන සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණ සිටි අවස්ථාවක දී ඔහු සිය ධූරය හැර ගියාක් සේ සලකනු ලබන්නේ නම් වේ.

***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ (8)ව්‍යවස්ථාව)***

41අ (1) අනු ව්‍යවස්ථාවේ (ඈ) සිට (ඊ) ඡේද යටතේ මන්ත්‍රීවරයන් සිව් දෙනාගෙන් එක් අයෙකු ලෙස හෝ විශිෂ්ට පුද්ගලයන් තිදෙනාගෙන් එක් අයෙකු ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් කරන ලද සාමාජිකයකු, නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේ ය.

***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ (10)ව්‍යවස්ථාව)***

13. පහත සඳහන් කොමිෂන් සභාවල සාමාජිකයන් ලෙස ජනාධිපතිවරයා විසින් කිසියම් තැනැත්තකු පත් කළ හැක්කේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත **පමණි**. එම කොමිෂන් සභා වන්නේ: -

- මැතිවරණ කොමිෂන් සභාව;
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව;
- ජාතික පොලිස් කොමිෂන් සභාව;
- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන්
- සභාව;
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව;
- මැතිවරණ කොමිෂන් සභාව;
- සීමා නිර්ණය කොමිෂන් සභාව;
- ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව.
- විගණන සේවා කොමිෂන් සභාව.

***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (1)ව්‍යවස්ථාව)***

14. ඉහත සඳහන් සෑම කොමිෂන් සභාවක් සඳහා ම ජනාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත සභාපතිවරුන් පත් කළ යුතු ය. මේ

සඳහා සභාව විසින් එක් එක් කොමිෂන් සභාව සඳහා නම් තුන බැගින් ජනාධිපතිවරයාට නිර්දේශ කළ යුතු ය.

***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (3)ව්‍යවස්ථාව)***

15. පහත තනතුරු සඳහා ජනාධිපතිවරයා විසින් සිදු කරන නාම යෝජනා අනුමත කිරීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඇත. එනම්ඃ -

- අග්‍රවිනිශ්චයකාරවරයා
- ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්;
- අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්;
- අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්.
- නීතිපතිවරයා;
- විගණකාධිපතිවරයා;
- පොලිස්පතිවරයා;
- පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්);
- පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා.

***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1)ව්‍යවස්ථාව)***

16. සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුතු ය. ***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඉ (3) ව්‍යවස්ථාව).*** කෙසේ වුව ද, සභාව විසින් කරනු ලැබිය යුතු ඕනෑම නිර්දේශයක් හෝ අනුමත කිරීමක් ද, ගනු ලබන ඕනෑම තීරණයක් ද බලසහිත වීමට නම් අවම වශයෙන් සභාවේ සාමාජිකයන් පස් දෙනෙකුවත් එය සනාථ කළයුතු ය.

17. සභාව විසින් කරනු ලැබිය යුතු සෑම නිර්දේශයක් හෝ අනුමත කිරීමක් ද ගනු ලබන සෑම තීරණයක් ද ඒකමතිකව තීරණය කිරීමට සභාව විසින් උත්සාහ දරනු ලැබිය යුතු ය. ඒකමතික තීරණයක් ගත නොහැකි අවස්ථාවක දී **<u>සභාවේ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් පස් දෙනකුට</u>** නොඅඩු සංඛ්‍යාවක් විසින් සනාථ කළහොත් මිස, සභාව විසින් කරන ලද යම් නිර්දේශයක් හෝ අනුමත කිරීමක් හෝ ගනු ලැබූ යම් තීරණයක් හෝ බලසහිත නොවිය යුතු ය. (රැස්වීමේ සභාපතිත්වය දරන සාමාජිකයාට මුල් ඡන්දයක් නොමැති නමුත්, සභාවේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු යම් නිර්දේශයක් හෝ අනුමත කිරීමක් හෝ තීරණයක් සඳහා සම සමව ඡන්දය ලැබුණු අවස්ථාවකදී තීරක ඡන්දයක් පමණක් හිමි වේ.)

***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඉ (4) සහ (5)ව්‍යවස්ථාවන්).***

18. සභාව විසින් එළඹෙනු ලබන සියලු ම තීරණ හෝ අනුමත කිරීම් සහ නිර්දේශයන් අවසානාත්මක වන අතර, අධිකරණයක් මගින් ප්‍රශ්න කිරීමට ලක් කළ හැක්කේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව මූලික අයිතිවාසිකම් පෙත්සමක් මගින් පමණි.

***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41එ ව්‍යවස්ථාව)***

19. රජයේ ගුවන් විදුලි සහ රූපවාහිනී සේවා ඇතුළුව රජයට අයත් යම් දේපළක් පවතින ආණ්ඩුව විසින් සිය මැතිවරණ කටයුතු සඳහා යෙදවීම වැළැක්වීමට මැතිවරණ කොමිෂන් සභාවට බලය ඇත.

***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 23 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (4) සහ (5) ව්‍යවස්ථාවන්)***

20. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ නියමයන් සහ කොන්දේසි මත මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙකු පත් කිරීමට ඉඩ සළසා ඇත.

***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 24 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ඉ (1) ව්‍යවස්ථාව)***

21. 41(ආ) (6) ව්‍යවස්ථාවේ දක්වෙන පරිදි, මැතිවරණ කොමිෂන් සභාව හැර එම ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් අන් සියලු කොමිෂන් සභා පාර්ලිමේන්තුවට වග කිවයුතු ය. පිළිතුරු දීමට බැඳී සිටිය යුතු ය. කෙසේ වුව ද, 104ආ (3) ව්‍යවස්ථාවට අනුව, මැතිවරණ කොමිෂන් සභාව විශේෂිතව ම පාර්ලිමේන්තුවට වගකිව යුතු අතර, පිළිතුරු දීමට බැඳී සිටිය යුතු ය. පාර්ලිමේන්තුව විෂයයෙහි මැතිවරණ කොමිෂන් සභාවෙහි කාර්ය භාරය පැහැදිලි නොවන අතර, මෙම ප්‍රතිපාදනය බලාත්මක කිරීම සඳහා ස්ථාවර නියෝග කිසිවක් පනවා නොමැත.

**ව්‍යවස්ථාදයකයෙහි සිදු වූ වෙනස්කම්**

22. පාර්ලිමේන්තුවේ කාල සීමාව වසර 6 සිට වසර 5 දක්වා අඩු කරන ලදී.***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 15 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 62 (2) ව්‍යවස්ථාව)***

23. සිය අභිමතය පරිදි පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට ඇති බලය මෙමගින් ඉවත් කෙරේ. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැක්කේ පහත අවස්ථාවල දී පමණි:-

- පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක් පිරිසකගේ යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසුරුවා හරින ලෙස ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කරනු ලැබුවහොත්.
- පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීම පැවැත්වූ දිනයෙන් අවුරුදු හතරක් සහ මාස හයක කාලයක් අවසන් වූ පසුව ඕනෑම අවස්ථාවක.

***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 17 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 (1) ව්‍යවස්ථාව)***

24. ද්විත්ව පුරවැසි භාවය සහිත පුද්ගලයන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත් කරගනු ලැබීමට සුදුසුකම් නොලබයි (92 (ආ) ව්‍යවස්ථාවට අනුව). මෙම වගන්තියට අනුව, ද්විත්ව පුරවැසි භාවය සහිත පුද්ගලයෙකු ජනරජයේ ජනාධිපතිවරයා ලෙස තෝරා පත් කරගනු ලැබීමට ද සුදුසුකම් නොලබයි.

***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 20 (4) වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 (1) (ඇ) (xiii) ව්‍යවස්ථාව)***

**වෙනත් වෙනස්කම්**

25. අමාත්‍යවරුන් (කැබිනට් සහ කැබිනට් නොවන යන දෙවර්ගයම) සංඛ්‍යාව සඳහා උපරිම සීමාවක් මෙමගින්

හඳුන්වා දී තිබේ. - එනම් කැබිනට් මණ්ඩලයේ මුළු අමාත්‍යවරුන් සංඛ්‍යාව **<u>තිහ</u>** නොඉක්මවිය යුතුය; කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරුන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාවේ එකතුව **<u>හතලිහ</u>** නොඉක්මවිය යුතු ය.***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 9 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 (1)ව්‍යවස්ථාව)***

ඊළඟ පාර්ලිමේන්තුවට පමණක් අදාළ වන විශේෂ අන්තර්කාලීන විධිවිධානයක් ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද පනත්කෙටුම්පතෙහි ඇතුළත් විය. එනම්, "ජාතික එක්සත් ආණ්ඩුවක්" පිහිටුවනු ලැබුවහොත්, කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාවෙහි උපරිම සීමාව **<u>හතළිස් පහ</u>** දක්වාත්, කැබිනට් නොවන අමාත්‍යවරුන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාවෙහි උපරිම සීමාව **<u>පනස් පහ</u>** දක්වා ද ඉහළ දැමිය හැකි ය.

කෙසේ වුව ද, "ජාතික ආණ්ඩුවක්" පිහිටුවනු ලැබුවහොත්, කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාව සහ කැබිනට් නොවන අමාත්‍යවරුන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව පාර්ලිමේන්තුව විසින් ම තීරණය කළ යුතු බවට කාරක සභා විවාදයේ දී මෙය සංශෝධනය කරන ලදී. කාරක සභා අවස්ථාවේ දී සිදු කරන ලද සංශෝධනයෙන් පසුව, මෙම විධිවිධානය මින් ඉදිරියට අදාළ වන්නේ ඊළඟ පාර්ලිමේන්තුවට **<u>පමණක්</u>** නොවේ. ***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 9 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 (4) සහ (5)ව්‍යවස්ථාවන්)***

26. නීතියෙන් ලබා දී ඇති පරිදි, තොරතුරු වෙත ප්‍රවේශවීමේ අයිතිවාසිකම ඇතුළත් කිරීම. ***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 2 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14අ ව්‍යවස්ථාව)***

27. රජය විසින් "වහා අවශ්‍ය වන පනත් කෙටුම්පත්" ලෙස නීති සම්මත කර ගැනීමට ඉඩ සළසා තිබුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ඉවත් කරන ලදී. - "ජාතියේ යහපත පිණිස වහා අවශ්‍ය වන්නා වූ" බවට කැබිනට් මණ්ඩලය විසින් සහතික කරනු ලබන පනත් කෙටුම්පතක් කෙළින් ම ශ්‍රේෂ්ඨාධිකරණය යොමු කිරීමට 19 වන ව්‍යවස්ථා සංශෝධනයට පෙර ජනාධිපතිවරයාට අවසර තිබුණි. ඉන්පසුව, ජනාධිපතිවරයාගේ උපදෙස් මත, එම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ද යන්න පැය 24ක් හෝ පැය 72ක් තුළ තීරණය කිරීම ශ්‍රේෂ්ඨාධිකරණයට විසින් සිදු කළ යුතුව තිබුණි.***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 30 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 ව්‍යවස්ථාව ඉවත් කිරීම මගින්)***

28. පනත් කෙටුම්පතක් (ගැසට් පත්‍රයේ පළ කිරීම මගින්) මහජනතාවට ප්‍රසිද්ධ කළ යුතු කාල සීමාව පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට පෙර දින 7 සිට 14 දක්වා වැඩි කර ඇත.***(19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 18 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 (1)ව්‍යවස්ථාව)***